# ශ්‍රී ලංකාවේ දියයට සංස්කෘතික උරුමයන් කළමනාකරණය පිළිබඳ මුහුදු පුරාවිද්‍යා ඒකකයේ කාර්යයභාරය

**අයි. යූ. හේවගේ**

මුහුදු පුරාවිද්‍යා ඒකකය
ගාල්ල
hewageindika@gmail.com

## හැඳින්වීම

1992 දී දියයට පුරාවිද්‍යාව නම් වූ, ලාංකිකයනට නවමු විෂය ක්ෂේත්‍රයෙහි දැනුම ලබා ගැනීමට ඒ වන විට ලෝකයේ දියයට පුරාවිද්‍යාවේ ප්‍රවීනයන් හා සම්බන්ධ වීමට සිදු විය. විශේෂයෙන්ම එහි දී දියයට පුරාවිද්‍යාවේ පෙරමුණේ පසු වූ රටක් වූ ඕස්ට්‍රේලියාවේ පුරාවිද්‍යාඥයන්ගේ සහයෝගය ඒ සඳහා ලබා ගැනීමට කටයුතු කරනු ලැබීය.1992 සිට දියයට පුරාවිද්‍යානුකූල කාර්යයන් සිදු කරන ආකාරය පිළිබිඳ මූලික දැනුමක් ලබා සිටි ලාංකිකයනට දුරස්ථ සන්නිවේදන ගවේෂණ ක්‍රම පිළිබිඳ අවබෝධයක් ලබා ගැනීමට හා ගාලු වරාය අවට සාගර පත්ලේ සැගවී ඇති පුරාවිද්‍යා ස්ථාන සොයා යාමට අවස්ථාවක් උදා වීය. ඒ 1998 වසරේ දී නව ගාලු වරාය ගොඩනැගීමට ප්‍රථම ගාලු මුහුදු බොක්ක කලාපයේ සිදු කිරීමට යෙදුනු පුරාවිද්‍යාත්මක ගවේෂණය හරහාය. ලාංකික හා ඕස්ට්‍රේලියානු කණ්ඩායමක් විසින් Side scan sonar හා Magnetometer යන උපකරණ ද භාවිතා කරමින් සිදු කෙරුණු එකී ගවේෂණයෙන් පුරාවිද්‍යාත්මක අතින් වැදගත් ස්ථාන 26ක් සොයා ගැනීමට සමත් විය.

## අන්තර්ගතය

ලංකාවේ දියයට පුරාවිද්‍යාත්මක කාර්යයන් සිදහා 1992 වසරේ සිට 2001 වසර දක්වා කාලය තුළ විදේශීය පුරාවිද්‍යාඥයින්ගේ මගපෙන්වීම යටතේ පුහුණුව ලැබූවන් හට හා අලුතෙන් දියයට පුරාවිද්‍යාව විෂය හා සම්බන්ධ වන්නන්හට වෙනම ම ඒකකයක් ගාල්ල පැරණි වරාය ආශ්‍රිතව ස්ථාපනය කරනු ලැබීම ලංකාවේ දියයට සංස්කෘතික උරුමයන් කළමනාකරණයට මහත් පිටුවහලක් විය. එය මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ පාලනය වන මුහුදු පුරාවිද්‍යා ඒකකය නමින් ස්ථාපනය කරනු ලැබීය. එසේ ස්ථාපනය කළ එම ඒකකයේ නිළධාරීන් හට දියයට පුරාවිද්‍යාව සම්බන්ධයෙන් මෙතෙක් නොලද දැනුම උකහා ගැනීමට අවස්ථාව උදා වූයේ 2001 වසරේ දී ආරම්භ කර 2004 වසරේ අවසන් කෙරුනු ඇවොන්ඩ්ස්ටර් නම් කැනිම් ව්‍යාපෘතිය හරහාය. ශ්‍රී ලංකා, නෙදර්ලන්ත හා ඕස්ට්‍රේලියානු පුරාවිද්‍යාඥයින්ගේ සහභාගීත්වයෙන් සිදු වූ මෙම ව්‍යාපෘතිය හරහා දියයට කැනීම් ක්‍රමවේද, ජලයෙන් හමු වන පුරාවස්තු සංරක්ෂණය, දියයට ඡායාරූපකරණය, වීඩියෝකරණය, සැලසුම්කරණය, දියයට වන විශාල පුරාවස්තු ගොඩ ගැනීම වැනි දියයට සංස්කෘතික උරුමයන් කළමනාකරණයට වැදගත් වන ක්‍රියාකාරකම් රැසකට සහභාගී වීමට ලාංකීය පුරාවිද්‍යාඥයන්ට හා සංරක්ෂකයින්ට අවස්ථාව උදා වීය.

මෙසේ වසර ගණනක් තිස්සේ ලද සිය අත්දැකීම් තුළින් පන්නරය ලබා ගත් ගාල්ල මුහුදු පුරාවිද්‍යා ඒකකයේ පුරාවිද්‍යා නිළධාරීන් 2004 වසරෙන් පසු ස්වාධීනව සිය කටයුතු පුලුල් කිරීමට කටයුතු කරනු ලැබීය. ප්‍රථමයෙන් දකුණු පළාත කේන්ද්‍ර කරගනිමින් දියයට සංස්කෘතික උරුමයන් කළමනාකරණ වැඩ පිළිවෙලක් ආරම්භ කරනු ලැබූ අතර ඒ අතරවාරයේ දියයට පුරාවිද්‍යාව පිළිබඳ විදේශීය රටවල පැවති

පුහුණු වැඩමුලු හා සම්මන්ත්‍රනවලට සහභාගී වෙමින් සිය ශක්‍යතාවන් වර්ධනය කර ගැනීමට කටයුතු කරනු ලැබීය. 2004 වසරේ සිට 2010 වසර දක්වා කාලය තුළ ඒකකය ලංකාවේ දකුණු වෙරළ තීරයෙහි වන දියයට සංස්කෘතික උරුම ස්ථානයන් බොහොමයක් වාර්තා ගත කිරීමට සමත් විය. එහි දී දකුණු පළාතේ කුඩා රාවනා හා මහා රාවනා පරයන් ආශ්‍රිතව සිදු කෙරුණු පුරාවිද්‍යාත්මක ගවේෂණවල ප්‍රතිඵල ලෙස එම ප්‍රදේශ ආශ්‍රිතව පවතින පුරාවිද්‍යාත්මක අතින් වැදගත් වන ගිලීගිය නෞකාවන් කිහිපයක් වාර්තාගත කිරීමට සමත් විය.

එසේම දකුණු පළාතේ අම්බලන්ගොඩ හික්කඩුව ප්‍රදේශ ආශ්‍රිතව පවතින දියයට සංස්කෘතික උරුම ස්ථාන කිහිපයක් ද වාර්තා ගත කිරීමට සමත් විය. එමෙන් ම අම්බලන්ගොඩ ධීවර වරායෙන් කිරි කවඩි, අරාබි අක්‍ෂර සහිත ලෝහ බිඳුන් කොටස් හා තවත් පුරාවස්තු හමු වූ පුරාස්ථානය අනාවරණය කර ගැනීම සිදහා 2011 වර්ෂයේ දී මුහුදු පුරාවිද්‍යා ඒකකයේ කණ්ඩායමට වරායේ කැනීමක් සිදු කරනු ලැබීය.

2007 වසරේ දී අප ඒකකයේ නිලධාරීන් හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කිමිදුම් අංශයේ නිලධාරීන් එක්ව දියයට සංස්කෘතික උරුමයේ ලංකාවේ සොයා ගැනුණු අද්විතීය සොයා ගැනීම සිදු කරනු ලැබීය. ඒ අම්බලන්තොට නගරයට නුදුරු ඉපැරණි ගොඩවාය වරායට ඔබ්බෙන් වූ සාගර පත්ලෙන් දකුණු ආසියාවේ මෙතෙක් සොයා ගැනුණු පැරණිම ජලාශ්‍රිත පුරා ක්ෂේත්‍රය සොයා ගැනීමය. ක්‍රි. පූ 01 - ක්‍රි.ව 02 අතර කාලයට අයත් යැයි සැලකෙන මෙම පුරා ක්ෂේත්‍රයෙන් විවිධ ප්‍රමාණයේ මැටි බිඳුන් විශාල වශයෙන් හමුවන අතර සංකේතාක්‍ෂර සහිත ගල් බංකු විශේෂයක් ද මෙම පුරා ක්ෂේත්‍රයෙන් හමු වේ.

තිස්වසරක් මුලුල්ලේ පැවති ත්‍රස්තවාදය නිසාවෙන් ලංකාවේ වයඹ, උතුරු හා නැගෙනහිර පලාත් ආශ්‍රිතව ත්‍රිකුණාමල වරායේ හැරෙන්නට කිමිදුම් කටයුතු සිදුකොට නොතිබිණ. 2009 වසරේ රටේ පැවති ත්‍රස්තවාදය පරාජය කිරීමෙන් අනතුරුව, ගාල්ල මුහුදු පුරාවිද්‍යා ඒකකයේ අභිප්‍රාය වූයේ එම ප්‍රදේශ ආශ්‍රිතව පවතින දියයට සංස්කෘතික උරුමයන් මොනවා ද යන්න හෙළි කිරීමය. එහි පළමු පියවර ලෙස වයඹ දිග ප්‍රදේශයේ හලාවත, පුත්තලම, කල්පිටිය, මන්නාරම යන ප්‍රදේශයන්ගේ 2010, 2011 වසරවල අදියර දෙකක් යටතේ දියයට පවතින උරුමය සොයා සිය කටයුතු මෙහෙයවීය. එහි දී එම ප්‍රදේශයන්ගේ දියයට පවතින උරුම ස්ථාන කිහිපයක් පිළිබිඳ තොරතුරු අනාවරණය කර ගැනීමට සමත් වූ අතර ඒවා වාර්තා ගත කෙරුණු අතර එම උරුම ස්ථාන පිළිබඳ වැඩිදුර පර්යේෂණ දියත් කිරීම අත්‍යාවශ්‍යය.

ඉන් අනතුරුව ගාල්ල මුහුදු පුරාවිද්‍යා ඒකකය 2012 වසරේ සිය පර්යේෂණ කලාපය ලෙස තෝරා ගනු ලැබුවේ නැගෙනහිර දිග ප්‍රදේශයයි. එහි දී ත්‍රිකුණාමලය, මඩකලපුව, පොතුවිල් යන ප්‍රදේශයන්ගේ සිදු කළ දියයට සංස්කෘතික උරුම ගවේෂණය ඉතා ප්‍රතිඵල සහිත එකක් විය. එහි දී ඉතා වැදගත් දියයට සංස්කෘතික උරුම ස්ථාන 16ක් සොයා ගැනීමට සමත් විය.

2013 වසරේ ගාල්ල මුහුදු පුරාවිද්‍යා ඒකකය විසින් උතුරු පලාත කේන්ද්‍ර කර ගනිමින් මුලතිව්, යාපනය, හා ඩෙල්ෆ් ආශ්‍රිතව ක්‍රියාත්මක කෙරුණු දියයට පුරාවිද්‍යා ගවේෂණය මගින් ද සංස්කෘතික උරුම ස්ථාන කිහිපයක් හඳුනා ගැනීමට හැකි විය.

## නිගමනය

මේ ආකාරයෙන් ගාල්ල මුහුදු පුරාවිද්‍යා ඒකකය සීමිත වූ නිලධාරීන් පිරිසකගෙන් සැදුම් ලද්දක් උවද ශ්‍රී ලංකාව වටාවන මුහුදු තීරයේ බොහෝ ස්ථානවල පවතින දියයට සංස්කෘතික උරුම ස්ථාන බොහොමයක් හිදුනා ගැනීමට හා ඒවා වාර්තාගත කිරීමට සමත් විය. විශේෂයෙන් ගාල්ලේ පමණක් දූනට ස්ථාපනය වී ඇති අප ඒකකය හරහා ලංකාව වටා පවතින දියයට සංස්කෘතික උරුමයන් කළමනාකරණය ඉතා භාරදූර කටයුත්තක්ව පවතී. නමුත් දිවයින වටා වන සංස්කෘතික උරුමය ආරක්ෂා කර ගැනීම සිදහා ඒකකය විසින් විවිධ ක්‍රියා මාර්ග ගෙන තිබේ. එහි දී

- රටේ විවිධ ප්‍රදේශයන්ගේ පවතින උරුම ස්ථාන පිළිබඳ ශ්‍රී ලංකා නාවික හමුදාව දැනුවත් කොට ඔවුන්ගේ සහය දියයට සංස්කෘතික උරුම ස්ථාන ආරක්ෂා කර ගැනීම සඳහා ලබා ගැනීම.
- යම් ප්‍රදේශයක පර්යේෂණ සිදු කළ පසු ඒකකය එහිදී සිදු කළ කටයුතු පිළිබඳව එම ප්‍රදේශයේ ජනතාව දූනුවත් කිරීම.

- ප්‍රදේශයේ පුද්ගලයින් හරහා අපට වැදගත් වන තොරතුරු ලබා ගැනීමට යාන්ත්‍රණයක් සැකසීම.
- දියයට සංස්කෘතික උරුමයන් ආරක්ෂා කර ගැනීම තුළින් එම ප්‍රදේශවල ජනතාවට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ දැනුවත් කිරීම.

එමෙන් ම දියයට සංස්කෘතික උරුමයන් කළමනාකරණයට ගාල්ල මුහුදු පුරාවිද්‍යා ඒකකය ගනු ලැබූ තවත් එක් වැදගත් ක්‍රියාමාර්ගයක් වන්නේ දැනට ගාල්ල කේන්ද්‍ර කර ගනිමින් දියයට සංස්කෘතික උරුමය නැරඹීමට උනන්දුවක් සංචාරකයන් හට එම ස්ථාන වෙත ගොස් ඒවා දැක බලා ගැනීමට අවස්ථාව උදාකර දීමය. විශේෂයෙන්ම දියයට උරුමයන් දැක බලා ගැනීමට පැමිණෙන විදේශීය සංචාරකයින් මගින් රටට ආර්ථික වාසියක් ද අත්කර ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත.

ආශ්‍රෙය ග්‍රන්ථ

Parthesius, Robert; Excavation Report Of The VOC Ship Avondter ,2007, Center for International Heritage Activities
http://www.mausrilanka.lk/